පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : පෙරදිග සංගීතය

ජූලි 4 වන සතිය

ශ්‍රේණිය : 06

සකස් කිරීම : ධනුෂ්ක සෙනවිරත්න.
කෑ/මාව/ගබ්බල සිරිසඟබෝ ම.වි. (මාවනැල්ල කලාපය)

Department of Education Sabaragamuwa Province/ Weekly School

# තුන් සරණේ ගීත.

## “තුන් සරණේ ගීත යනු තුනුරුවන් උදෙසා භක්තියෙන් ගැයූ ගී විශේෂයකි”

**මෙම ගීත වල දැකිය හැකි ලක්ෂණ :-**

- වන්දනා ගමන් වලදී විශේෂයෙන් ගායනා කරනු ලබයි.
- ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගී ඇත.
- බුද්ධාලම්බන ප්‍රීතිය ඇති කරන ගී විශේෂයකි.
- පද මාලාව සරල ය. ඉඤ්ඤයි,ගඤ්ඤයි වැනි ගැමි වහර භාවිත වේ.
- නඩේ ගුරා ගායනා කළ පසු සෙසු අය අනුකරණය කරමින් ගායනා කරයි.
- සාමූහික බව සහ නායකත්වයට ගරු කරීම වැනි ගුණාංග වර්ධනය කරයි.
- පටු ස්වර පරාසයක ඒකාකාරී නාදමාලාක් දැකිය හැකිය.
- මාත්‍රා 3න් 3ට බොහෝ තුන් සරණේ ගී නිර්මාණය වී ඇත.

<u>මෙම තුන් සරණේ ගීත කෝමළ හා ශුද්ධ ස්වර වශයෙන් දෙආකාරයෙන් ගායනා කරනු ලබයි.</u>

ශුද්ධ ස්වර යොදාගනිමින් නිර්මාණය වී ඇති තුන් සරණේ ගීතයක්.

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ධ̣ | ස | ස | රි | ග | රි | ග | ම | - | ග | රිස | රි |
| ග | ම | ග | රි | රි | ග | ස | රිස | ගරි | ස | - | - |

බුද්ධං සරණේ සිරස දරාගෙන
ධම්මං සරණේ සිත පහදා ගෙන
සංඝං සරණේ සිවුරු දරාගෙන
ඉඤ්ඤයි තුන් සරණේ අදහාගෙන

ඊ තක්සලාව වෙබ් අඩවියේ මෙම පාඩමට සම්බන්ධ හඬ පටය මෙම සබැඳියෙන්,

https://www.e-thaksalawa.moe.gov.lk/content/songs/thunsarane_geetha_budhdhan.mp3

කෝමළ ස්වර යොදාගනිමින් නිර්මාණය වී ඇති තුන් සරණේ ගීතයක්

| 1 2 3 | 1 2 3 | 1 2 3 | 1 2 3 |
|---|---|---|---|
| නි නි ස | රි ගු - | රි ගු රි | ස - - |
| නි නි ස | රි ගු රි | රි ගු රි | ස - - |

අලුයම බුද්ධං සරණේ ගඤ්ඤැයි
මද්දිම ධම්මං සරණේ ගඤ්ඤැයි
සවසට සංඝං සරණේ ගඤ්ඤැයි
තුන් යමට ම තුන් සරණේ ගඤ්ඤැයි

ඊ තක්සලාව වෙබ් අඩවියේ මෙම පාඩමට සම්බන්ධ හඬ පටය මෙම සබැඳියෙන්,

https://www.e-thaksalawa.moe.gov.lk/content/songs/thunsarane_geetha_perayama.mp3

පැවරුම් :- තුන් සරණේ ගී ඇතුලත් පොත් පිංචක් සදන්න.

තුන් සරණේ ගී කට පාඩම් කරගන්න.